මධ්‍යම පළාත් සභාව සඳහා කොන්ත්‍රාත් පදනම මත දිව්වා අතිරේක කාර්ය මණ්ඩලය සඳහා තාවකාලිකව ඉංජිනේරු තනතුර සඳහා වන බඳවා ගැනීම

මධ්‍යම පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා කොන්ත්‍රාත් පදනමින් තාවකාලිකව ඉංජිනේරුවරයන් බඳවා ගනු ලැබේ.

මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම යටතේ වන අතර 2026.12.31 දින දක්වා වේ.

තනතුරු පිළබඳව විස්තර පහතින් දැක්වේ.
සිවිල් ඉංජිනේරු (ව්‍යුහ හා සැලසුම්) - තනතුරු 03

1. මාසික දීමනාව -
   දැනට බලාත්මක රා.ප.ච. 10/2025 ට පරිදි විධායක සේවා මට්ටමෙහි 1 ශ්‍රේණියට අයත් SL 1-2025 වැටුප් කේතයේ 1 ශ්‍රේණියේ ආරම්භක වැටුප් තලයට සමානුපාත වන පරිදි කොන්ත්‍රාත් දීමනාව හා 2024.01.10 දිනැති රා.ප.ච. 03/2024 විධිවිධාන අනුව ජීවන වියදම් දීමනාව.

2. සුදුසුකම්
   2.1. අධ්‍යාපන සුදුසුකම්
   (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක එම කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති වසර 04 ක පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධි පාඨමාලාවට බඳවාගනු ලබන විෂය ධාරාවක් යටතේ සාර්ථකව සම්පූර්ණ කර උපාධිය ලබා තිබීම
   හෝ
   (ii) 2.1. (i) හි දැක්වෙන උපාධි පාඨමාලාවට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යාපන සහ අනිකුත් සියළු අවශ්‍යතා බඳවාගනු ලබන විෂය ධාරාවක් යටතේ සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතිකය ලබා තිබීම.
   2.2. වෘත්තීය සුදුසුකම්
   (i) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් අධ්‍යාපන අවශ්‍යතා සම්පූර්ණ කර එහි ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් සපුරා තිබෙන බව සනාථ කිරීමට එම ආයතනය විසින් නිකුත් කරනු ලබන වලංගු සහතිකයක් ලබා තිබීම.

   හා

   (ii) ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වී තිබීම.

   (iii) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 03 සඳහා

   I. වරලත් ඉංජිනේරුවරයෙකු වීම. හා
      මාර්ග,පාලම්,බෝක්කු වල ව්‍යුහ සැලසුම් සකස් කිරීම සම්බන්ධව අවම වසර 05 ක පළපුරුද්දක් තිබීම.
   II. මාර්ග , පාලම් , බෝක්කු සකස් කිරීමේ අධීක්ෂණය සම්බන්ධයෙන් අවම වසර 05 ක ක්ෂේත්‍ර පළපුරුද්දක් තිබීම.

3. වයස - අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි.

4. පොදු කොන්දේසි

1) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4) සෑම අයදුම්කරුවකුම තනතුරට බඳවා ගැනීම සඳහා අදාල වන සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5) යම් ආගමික නිකායක පැවිදිවරයෙක් දරන කිසිදු තැනැත්තෙකු අයදුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

6) රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරනු ලබන්නේ නම් ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

7) අයදුම්කරුවන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පත සකස් කර එවිය යුතු අතර තමා පිළිබඳ තොරතුරු ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ සම්බන්ධ කර ගත හැකි තොරතුරු සඳහන් කර එවිය යුතුය.

8) ඔබ විසින් යොමු කරනු ලබන අයදුම්පත්‍රයෙහි සඳහන් වී ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් නුසුදුස්සකු සේ සලකා ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමේන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කරනු ලැබේ.

9) අදාල ක්ෂේත්‍රයේ පලපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

5. බඳවා ගන්නා ක්‍රමය - සියලුම තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ.

6. මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම, අයදුම්කරු මෙම තනතුර සඳහා පත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

7. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් ජීව දත්ත විස්තර ඇතුළත් කර සකස් කරන ලද අයදුම්පත්‍ර අදාළ සහතිකවල පිටපත්ද (සහතික කරන ලද ) සමඟ බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කර 2026.07.17 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

8. බඳවා ගනු ලබන නිලධාරීන් වෙත විශ්‍රාම වැටුපකට හිමිකමක් , රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ පත්වීමක් ලැබීමට විශේෂ හිමිකමක් ලැබීමට හෝ විශේෂ ලකුණක් හිමිවීමට මෙම පත්වීම අදාල නොවේ.

9. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
මධ්‍යම පළාත

තැ.පෙ. 102,
ප්‍රධාන ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත් සභා සංකීර්ණය , පල්ලේකැලේ,
කුණ්ඩසාලේ.

දුරකථන අංකය - 081-4953289/90

ලකුණු ලබාදීමේ නිර්ණායකයන්

| නිර්ණායක | උපරිම ලකුණු |
|---|---|
| ඉංජිනේරුවකු ලෙස ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද | 20 |
| වෘත්තීය සුදුසුකම් | 25 |
| විශේෂිත තාක්ෂණික පළපුරුද්ද | 10 |
| අමතර අධ්‍යාපන සුදුසුකම් | 15 |
| වෙනත් සුදුසුකම් | 20 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 10 |
| මුළු ලකුණු | 100 |

ආදර්ශ අයදුම්පත්‍රය

මධ්‍යම පළාත් සභාව සඳහා කොන්ත්‍රාත් පදනම මත දිට්වා අතිරේක කාර්ය මණ්ඩලය සඳහා තාවකාලිකව ඉංජිනේරු තනතුරට බඳවා ගැනීමේ අයදුම් පත්‍රය.

මාධ්‍ය - සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

පදිංචි දිස්ත්‍රික්කය :- ...........................................................

01.

1.1 මුලකුරු සමඟ නම :- Mr/Mrs/Miss.......................................................................................
ඉංග්‍රීසි කැපිටල් අකුරින් (උදා:- SILVA A.B.C.D.)

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-

.......................................................................................................................................

1.3 මුලකුරු සමඟ නම :- ...........................................................................................................

මහතා/මහත්මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

.......................................................................................................................................
.......................................................................................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්/දෙමළෙන්) :-
.......................................................................................................................................
.......................................................................................................................................

02.

2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :-
.......................................................................................................................................
.......................................................................................................................................

2.2 දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් කාර්යාලීය ලිපිනය :-
.......................................................................................................................................
.......................................................................................................................................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය :- ...................................................

2.4 ස්ත්‍රී/පුරුෂ භාවය :- පුරුෂ ☐ ස්ත්‍රී ☐

03

3.1 උපන් දිනය :-........................................

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2026.06.22) වයස :- අවුරුදු: .......... මාස: .......... දින: ..........

3.3 දුරකථන අංකය ජංගම :- ස්ථාවර :-

(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳව දැනුම්දීම සඳහා)

3.4 විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) :-
.............................................................................................

04. විවාහක/අවිවාහක බව :- අවිවාහක ☐ විවාහක ☐

05.

5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ..........................................................................................

06. අධ්‍යාපන සුදුසුකම් :-

......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................

07. වෘත්තීය සුදුසුකම් :-

......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................

08. අයදුම්කරු විසින් කරන ලද ක්‍රියාවන් පිළිබඳ විස්තර (අදාළ වේ නම්):-

......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................

10. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා තිබේද ?

......................................................................................................................................................

එසේ නම් විස්තර දක්වන්න: :-

......................................................................................................................................................

......................................................................................................................................................

11. අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.

....................... .....................................

දිනය අයදුම්කරුගේ අත්සන

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:-
(සාමදාන විනිශ්චයකාරයකු / රජයේ සේවයේ විධායක මට්ටමේ රජයේ නිලධාරියෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් සහතික කළ යුතුය)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................................................................
මහතා/මහත්මිය/මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

................................... ................................................

දිනය සහතික කරන්නාගේ අත්සන
(නිල මුද්‍රාව සහිතව)

සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ..........................................................................................

තනතුර :- ..........................................................................................................................

ලිපිනය :- ..........................................................................................................................

13 අයදුම්කරු රජයේ / පළාත් රාජ්‍ය සේවාවේ නියුතු අයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-

........................................................... මහතා /මහත්මිය / මෙනවියගේ අයදුම්පත්‍රය ඉදිරිපත් කරමි.

ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ................................................... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් පදනමින් සේවය කරන බවත් , මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

.................................... ....................................................

දිනය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව සහිතව)